# කාන්තාවන් විදේශ රැකියා සඳහා ඇදීයාම
## (ශ්‍රී ලංකාව ඇසුරින්)

එච්.ඩී.පී. මධුෂානි[1] ඩබ්.වී.පී.එම්. නයෝමි[2]
ඩී.එම්.එච්. දසනායක[3] එල්.ජී.ඩී. පෙරේරා[4]

**සංක්ෂේපය**

වර්තමානය වන විට කාන්තාවන් මෙරට රැකියාවක නියුක්ත වීමට දක්වන කැමැත්තට වඩා විදේශ රැකියාවල නිරත වීමට කැමැත්තක් දක්වන බවක් දක්නට ලැබේ. මෙයට හේතුව වී ඇත්තේ අධ්‍යාපන මට්ටමද නැතහොත් කාන්තාවන් සහ පුරුෂයන් අතර විශාල වැටුප් විෂමතාවක් පැවතීමද යන්න විමසිය යුත්තකි. එබැවින් විදේශ රැකියාවල නිරත වීමට රුචිකත්වයක් දැක්වීමට හේතුව කුමක්ද යන්න අධ්‍යයන ගැටළුව කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ විදේශ රැකියා සඳහා වැඩි රුචිකත්වයක් දැක්වීමට හේතු හඳුනා ගැනීමයි. අධ්‍යයනය සඳහා ද්විතියික දත්ත භාවිතා කළ අතර ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් දත්ත ලබාගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම දත්ත විශ්ලේෂණ සඳහා භාවිතා කළ අතර අධ්‍යයනය මගින් අනාවරණය වූයේ ශ්‍රී ලාංකිකයන් මිලියන දෙකක පමණ ප්‍රමාණයක් විදේශ රැකියාවල නියුතු බවත් ඉන් 52%ක් වැනි ප්‍රමාණයක් කාන්තාවන් බවත්ය. එමෙන්ම මෙරට තුළ වැඩකිරීමට කාන්තාවන් දක්වන රුචිකත්වය පිළිබඳ ගැටලුකාරී තත්වයක් පවතින බව හෙළිවිය. විදේශ රැකියාවල නියුතු කාන්තාවන්ගෙන් බහුතරයක් එතරම් ආකර්ෂණීය නොවන ගෘහ සේවිකා රැකියා වල නියැළී සිටියි. අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ එවැනි රැකියා වල පවතින අර්බුධයන් පිළිබඳ දැනුවත් වී තිබුණද ඔවුන් විදේශ රැකියා සඳහා යොමු වී තිබෙන්නේ ඔවුනගේ සමාජ ආර්ථික පසුබිමෙහි අඩුලුහඬුකම් රාශියක් ඇති බැවිනි. ශ්‍රී ලංකික නීති රාමුව මගින් ද කාන්තාවන්ට නිසි ආරක්ෂාවක් සහ රැකවරණයක් ලබාදිය හැකි පනත් ක්‍රියාකාරී මට්ටමකට ගෙන ඒම සම්බන්ධව ඉතා පසුගාමී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරන බව තහවුරු විය. දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය කරගත් කරුණු වූයේ දැනට දේශීය

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
pavithrahdm@gmail.com
[2]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,
wickramasinghe.mahesha@yahoo.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,
harshanidasanayake1991@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
gdinusha.perera@gmail.com

රැකියා වල නියුතු කාන්තාවන්ට රැකියා වල ඉහළ ස්ථරයන්ට ගමන් කිරීමේදී විශාල ගැටලුවකට මුහුණ පෑමට සිදුවන බව මෙන්ම කාන්තා සහ පුරුෂයින් අතර විශාල වැටුප් විෂමතාවක් පවතින බවයි. දේශිය රැකියා වෙළෙඳපොළ තුළ කාන්තා දායකත්වය පවතින්නේ අඩු මට්ටමක වන අතර රැකියා වල ක්‍රියාකාරීව නියුතු වන කාන්තාවන්ට ලැබෙන පහසුකම් සහ ආර්ථික ප්‍රතිලාභ පුරුෂයින්ට සාපේක්ෂව අවම මට්ටමක පවතී. මෙම නිසා ආර්ථික පරිසරය තුළ කාන්තා සහභාගීත්වය දිරිගැන්වීම සඳහා නිසි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුය.

**මූඛ්‍ය පද :** *විදේශ රැකියා, ගෘහ සේවිකා, වැටුප් විෂමතාව, රැකියා වෙළෙඳපොළ*